# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

## පුරප්පාඩු

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, මනා ලෙස ස්ථාපිත ලාබ උපයන වාණිජ මුද්‍රණ, ආරක්ෂණ මුද්‍රණ, ප්‍රකාශන මුද්‍රණය, ලිපි ද්‍රව්‍ය මුද්‍රණ හා අලෙවිකරණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර කටයුතු සිදු කරන වාණිජ ආයතනයක් වන අතර, අලෙවි කළමනාකරණ තනතුර සඳහා ප්‍රතිඵල සහිත මනා චරිතවත් ශ්‍රී ලාංකිකයකු සොයනු ලැබේ.

**කළමනාකරණ තනතුර ( අලෙවි ) ( HM 1-1) (තනතුරු 01 යි)**

**රැකියා විස්තරය**

අලෙවි දෙපාර්තමේන්තුවේ කාර්ය භාර නිලධාරියා ලෙස, අලෙවි දෙපාර්තමේන්තුවේ කළමනාකරණ කටයුතු, සංස්ථාවේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට විකුණුම් හා අලෙවි අංශයට අවශ්‍ය ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමෝපායන් හඳුන්වා දීම සහිත සමස්ත සුපරීක්ෂණය සිදු කිරීම.

**සුදුසුකම්**

**අධ්‍යාපනික : (බාහිර)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය (අලෙවිකරණ හෝ ව්‍යාපාර කළමනාකරණ උපාධියක් යෝග්‍ය වේ) සමග පශ්චාත් උපාධි (ශාස්ත්‍රවේදී) සුදුසුකමක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ඒකාබද්ධ සාමාජිකත්වයක් සහිතව රාජ්‍යයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවකෙ (15)පළපුරුද්ද.

**(අභ්‍යන්තර)**

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ තලයේ 1 ශ්‍රේණියේ තනතුරක අවම මට්ටමේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුවන් මේ සඳහා සුදුසුකම් ලබනු ඇත.

බැඳවාගන්නා ක්‍රමවේදය – ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස් සීමාව :** වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :**

2027.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි,

M M 1-1 – රු. 140,640/–15×4,100–202,140/–(මාසිකව) 2025.03.25 දිනැති

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025

| HM 1-1 | | |
|---|---|---|
| 2025 | 2026 | 2026 |
| 105,399.00 | 123,019.00 | 140,640.00 |

**වෙනත් ප්‍රතිලාභ**

- චක්‍රලේඛ අංක PED 1/2015(ii) අනුව ප්‍රවාහන දීමනාව ලැබේ.

**සේවා ස්වභාවය**

ඉහත තනතුර ස්ථිර වන අතර, අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. දැනටමත් අභ්‍යන්තරිකව තෝරාගත් තනතුරේ ස්ථිර කළ සේවකයින් හට අවුරුදු එකක (01) වැඩබලන කාලයකට යටත් වේ.

**දීමනා :**

වැටුපට අමතරව තනතුර සඳහා පහත සඳහන් දීමනා සඳහා සුදුසුකම් ලැබේ.

- චක්‍ර ලේඛ අනුව රජය අනුමත දීමනා.
- පැමිණීමේ දිරිදීමනා.
- ආහාර දීමනාව
- **වෙනත් දීමනා.**
- සේවකයා හා පවුල සඳහා වන වෛද්‍ය රක්ෂණ ක්‍රමය.
- KPI ඇගයුම අනුව දිරිදීමනා.
- EPF හා ETF.
- ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම්.

**අයදුම් කරන ආකාරය:**

2025.06.14 වන විට අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කෙරෙන හා උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් සමග අයදුම්පත් යොමුකළ යුතුය. ඉහත කරුණු වලට අදාළ නොවන ලෙස ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රජයේ රාජ්‍ය/ ආයතන / සංස්ථා/මණ්ඩල වල සේවය කරන අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ අංශ ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

- අයදුම්පත් එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.**
- සියලුම අයදුම්පත් පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් **"සභාපති, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක"** වෙත හෝ අතින් ගෙනවිත් 2025.06.14 දිනට ඒට පෙර ලැබෙන පරිදි යොමු කළ යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- මෙහි සඳහන් නොවන යම් කරුණක් වේ නම්, බැඳවා ගැනීම් නිලධාරියා විසින් එය තීරණය කරනු ලැබේ. කිසියම් ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**සභාපති,**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානළුව, පාදුක්ක.**

SPC